**ශීර්ෂය 325 - ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 04 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනුලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුණද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
  මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(ඇ.) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (අ) (ආ) ඡේදයන්හි ඇතුළත් නිරීක්ෂණ අනුව පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වාදෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) චක්‍රලේඛයේ 7(v) ඡේදය ප්‍රකාරව ශුද්ධ වත්කම් ගණනය කරන ආකාරය දක්වා තිබුණි. ඒ අනුව ගණනය නොකිරීමෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඒසීඒ - පී හී මුළු වත්කම් හා මුළු වගකීම් අතර රු.299,675 ක වෙනසක් නිරීක්ෂණය විය. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කිරීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම. | අතපසුවීමකින් ශුද්ධ වත්කම් ගණනය කිරීමේදී මුළු වත්කම්වලින් තැන්පතු ගිණුම් ශේෂය අඩුවී නොමැති බැවින් මෙම වෙනස සිදුවී ඇත. |
| (ආ) ඒසීඒ - 2(i) වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත්කර ගැනීම් රු.42,082,709 ක් වුවද, එම වටිනාකම ඒසීඒ - 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මිලදී ගැනීම් මඟින් අත්පත්කර ගැනීම් ලෙස දක්වා නොතිබුණි. එම නිසා මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ වටිනාකම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන, ඊට අදාල වන අනෙකුත් වාර්තාවල ඇතුළත් සංඛ්‍යාවන්ට අනුරූප විය යුතු වීම. | මුද්‍රිත සටහන්වල වත්කම් යටතේ වර්ෂ අවසාන ශේෂය ලෙස සඳහන්ව තිබුණේද වර්ෂය මුල පැවති ශේෂය බැවින් ඒ බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී වර්ෂය තුළ මිලදී ගැනීම් ඇතුලත් කර ගැනීමට උත්සහ කළද ගිණුම් පිළියෙල කරනු ලබන දිනය වන විටත් එම දෝෂය නිවැරදි වී නොතිබුණ බැවින් භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය පිළියෙල කර ඉදිරිපත් කරන ලදී. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම (Consolidated Trial Balance) අනුව අග්‍රිම ලැබීම්, රු.323,170,000 ක්, වෙනත් ලැබීම් රු.3,613,274 ක් හා පොදු තැන්පතු ලැබීම් රු.2,721,276 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ වෙන් වෙන්ව දැක්විය යුතු වුවත් ඉහත සඳහන් සියළු අග්‍රිම ලැබීම් රු.329,504,550 ක එකතු වටිනාකමක් ලෙස දක්වා තිබුණි. | ලැබීම් නිසි පරිදි වර්ගීකරණය කර නියමිත ආකෘතිවල වාර්තා කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් සංඛ්‍යා නිවැරදි බවත්, අතපසුවීමකින් උපචිත පදනම මත ඒවා වර්ගීකරණය කර ඇති බැවින් නියමිත ආකෘතියට අනුව නැවත නිවැරදිව පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කෙරේ. |
| (ආ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද සහ ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් පදනම මත වැය කරන ලද වටිනාකම පිළිවෙලින් රු.70,226,245 ක් සහ රු.256,568,104 ක් විය යුතු වුවත්, මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ එම අගයන් උපචිත පදනම මත පිළිවෙලින් රු.71,116,960 ක් සහ රු.258,387,590 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද වටිනාකම රු.890,715 කින්ද, ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද වටිනාකම රු.1,819,486 කින්ද, වැඩියෙන් දක්වා තිබුණි.<br><br>තවද, සමාලෝචිත වර්ෂය සඳහා වූ තැන්පතු ගෙවීම් රු.2,710,201 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මුදල් ප්‍රවාහයන් නිසි පරිදි හඳුනාගෙන වාර්තා කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් සංඛ්‍යා නිවැරදි බවත්, අතපසුවීමකින් උපචිත පදනම මත ඒවා වර්ගීකරණය කර ඇති බැවින් නියමිත ආකෘතියට අනුව නැවත නිවැරදිව පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කෙරේ. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ඒසීඒ - සී) තුළ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහයේ එකතු වටිනාකම රු.71,655,117 ක් විය යුතු වුවත් එම එකතුව රු.71,116,960 ක් ලෙස රු.538,157 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මුදල් ප්‍රවාහයන් නිසි පරිදි හඳුනාගෙන වාර්තා කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් සංඛ්‍යා නිවැරදි බවත්, අතපසුවීමකින් උපචිත පදනම මත ඒවා වර්ගීකරණය කර ඇති බැවින් නියමිත ආකෘතියට අනුව නැවත නිවැරදිව පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය මේ සමඟ ඉදිරිපත් කෙරේ. |

### 1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ඉතා කඩිනමින් අභ්‍යන්තර විගණක හා සම්බන්ධ වී මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571 (3) ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු, රාජ්‍ය ආදායමට බැර කිරීම හෝ ආපසු ගෙවීම සිදු කළ යුතුයි. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දින පැවති | ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් බාහිර ආයතනයක් මඟින් ලබාගන්නා ලද සේවාවක් වෙනුවෙන් රඳවා ගැනීමේ තැන්පතුවක් ලෙස මෙම මුදල රඳවා තබාගෙන ඇති අතර, මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීම සඳහා අදාල පාර්ශවයන් මේ |

| | |
|---|---|
| රු.288,600 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | වන විටත් දැනුවත් කර ඇත. ඒ අනුව ඉදිරියේදී මු.රෙ.571(3) ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. |

**2.2 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිකුත් කරන ලද දින සිට මාස 06 ක් ඉක්ම වූ බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු.232,218 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | තවදුරටත් මාස 06 ඉක්මවූ ප්‍රේෂණපත් සඳහා අවසන් සිහිකැඳවීම් ලිපි යොමුකර කඩිනමින් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ රෝහණ ආයතනය තුළ උසස් පුහුණු හා පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.මිලියන 30.09 ක මුදලක් වැය කළ පසුව 2017 ජූලි 22 වන දින සිට ව්‍යාපෘතියේ වැඩ කටයුතු අතහැර දමා තිබුණි. | නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේදී සියළුම කරුණු සැලකිල්ලට ගෙන නිසි සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ද විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

## 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ට්‍රක් රථයක ටින්කරින් හා පින්තාරු වැඩ ඉටුකර ගැනීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු.777,000 කට පිරිනමා තිබුණි. එසේ වුවද වාහනය ටින්කරින් කිරීම සහ පින්තාරු කිරීම සඳහා වූ ලිපිගොනුවල හා විවිධ ලේඛනවල වාහනයේ ලියාපදිංචි අංකය විවිධාකාරයෙන් දක්වා තිබුණි. | දෙපාර්තමේන්තුව පවත්වාගෙන යන ලේඛනවල නිවැරදිතාවය පිළිබඳව සැලකිලිමත් විය යුතු වීම. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ප්‍රකාරව භාණ්ඩ හා වැඩ ප්‍රසම්පාදනයේදී සියළුම ආශ්‍රිත වියදම් ඇතුළුව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතුයි. එසේ වුවද මුළු පිරිවැය ඇස්තමේන්තු සකස්කිරීමකින් තොරව අවස්ථා 15 කදී රු. 3,509,481 ක් වටිනා වත්කම් හා තොග මිලදී ගෙන තිබුණි. | විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතුවලදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නීත්‍යානුකූල අයිතිය පවරා නොගත් පර්චස් 1263.45 ක් වූ ඉඩම් කොටස් 09 ක ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් 2011 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.82,158,588 ක පිරිවැයක් දරා තිබුණි. | අදාල ඉඩම්වල අයිතිය නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහනයක ටින්කරින් හා පින්තාරු වැඩ වටිනාකම රු.777,000 කට අදාළ කොන්ත්‍රාත්තුවේ කාර්යය නිමවා වාහනය ප්‍රමාද වී ලබාදී තිබීම හේතුවෙන්, කොන්ත්‍රාත් ගිවිසුමේ පරිදි අය කළ යුතු ප්‍රමාද ගාස්තුව අය නොකර ගෙවීම් කිරීම නිසා රු.42,735 ක අලාභයක් සිදුවී තිබුණි. | ප්‍රමාදවී සපයන ඇණවුම් සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකරගෙන ගෙවීම් කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණ සහයක තනතුරු 03 ක් හා කාර්යාල කාර්ය සහායක තනතුරක් දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර තිබූ නමුත් එම තනතුරු පුරප්පාඩුව පැවතිණි. | අනුමත කරන ලද පුරප්පාඩු වී ඇති තනතුරු පිරවිය යුතු වීම. | අදහස් දක්වා නොමැත. |